# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2247/30 – 2021 ඔක්තෝබර් 01 වැනි සිකුරාදා – 2021.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2072/21 හා 2018.05.23 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2018 අංක 98 හා 2018.05.18 වැනි දින දරන ආඥාවෙ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2072/21 හා 2018.05.23 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2018 අංක 98 හා 2018.05.18 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2017/UDA/92.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කැප්‍රාලේ/8/4/අත්1/මැක්පැක්.
2021 සැප්තැම්බර් මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 584ඒ, නාම්පමුණුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාම්පමුණුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KSB/2017/341 හා 2017.09.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 – නුගගහලන්ද – ප්‍රමාණය: හෙක්. 1.0232**
උතුරට: පාර, ඩී. කේ. ඩී. ඔස්ටින් විජයානන්ද, ඒ. ඩී. මිසිලින් නෝනා හිමිකම් කියන ගොරොක්ගමකුඹුර ඕවිට, ඒ. ඩී. ප්‍රේමසිරි සහ තවත් අය හිමිකම් කියන කොස්ගහකුඹුර; නැගෙනහිරට: ඩී. කේ. ඩී. ජී. ගුණරත්න සහ ඩී. කේ. ඩී. එල්. ගුණරත්න හිමිකම් කියන නුගගහලන්ද සහ කැබලි අංක 6; දකුණට: කැබලි අංක 6, ගොරකපිටිය පාර, කැබලි අංක 5, 4, 3 සහ 2; බටහිරට: පාර.

02. **කැබලි අංක 6 – වරි. අංක 201, ගොරකපිටිය පාර – ප්‍රමාණය: හෙක්. 0.2320**
උතුරට: කැබලි අංක 1 සහ ඩී. කේ. ඩී. එල්. ගුණරත්න හිමිකම් කියන නුගගහලන්ද; නැගෙනහිරට: කැබලි අංක 7; දකුණට: ගොරකපිටිය පාර; බටහිරට: කැබලි අංක 1.

03. **කැබලි අංක 7 – නුගගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.5052**
උතුරට: ඩී. කේ. ඩී. එල්. ගුණරත්න හිමිකම් කියන නුගගහලන්ද සහ පාර; නැගෙනහිරට: පාර; දකුණට: ගොරකපිටිය පාර; බටහිරට: කැබලි අංක 6.

10 – 147

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

1992 ජූලි 31 වැනි දින අංක 725/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1992 අංක 105 දරන ආඥාවේ සහ එම ආඥාවට සංශෝධනයක් කරමින් 1992 දෙසැම්බර් 30 වැනි දින අංක 747/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1992 අංක 105 දරන ආඥාවේ ශුද්ධි පත්‍රිකාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 3J/91/LRB/270.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: BER/4/5/3/8.
2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා මහතා විසින් පිළියෙළ කරන ලද අංක 91/11/10 හා 1991.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අංක 3, 6 හා 9 දරන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස් 03ට මායිම්:

01. **කැබලි අංක 03 – මාගල්ල වෙල – ප්‍රමාණය: හෙක්. 0.064**

උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 7; දකුණට: කැබලි අංක 4; බටහිරට: කැබලි අංක 1.

02. **කැබලි අංක 06 – මාගල්ල වෙල – ප්‍රමාණය: හෙක්. 0.089**

උතුරට: කැබලි අංක 5; නැගෙනහිරට: කැබලි අංක 7; දකුණට: කිරන්තිය පාර; බටහිරට: කැබලි අංක 1.

03. **කැබලි අංක 09 – මාගල්ල වෙල – ප්‍රමාණය: හෙක්. 0.546**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 10; බටහිරට: කැබලි අංක 8.

10 – 148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.